# අධ්‍යාපන අමාත්‍යාංශය
# දිවයින පුරා පිහිටි ජාතික පාසල්වල පුරප්පාඩු වී ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ විදුහල්පති තනතුරු පුරප්පාඩු පිරවීම - 2020

**මේ සමඟ ඇති උපලේඛනයේ සඳහන් ජාතික පාසල්වල විදුහල්පති තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසු නිලධාරීන් තෝරාගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**01. සුදුසුකම්**

i. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙක් වීම.

**සටහන 1**: අයදුම්පත් කැඳවීමේ අවසන් දිනවන විට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලැබීමට, අංක 1225/32 හා 2002.03.01 දිනැති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා පූර්ව සේවා ව්‍යවස්ථාවේ හෝ අංක 1928/28 හා 2015.08.21 දිනැති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා නව සේවා ව්‍යවස්ථාවේ හෝ විධිවිධාන අනුව සුදුසුකම් ලබා ඇතත්, මෙතෙක් එම උසස්වීම් නොලද සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන්ට ද මෙම පුරප්පාඩු සඳහා අයදුම් කළ හැකිය. (සම්මුඛ පරීක්ෂණ අවස්ථාව වන විට I ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන් පමණක් අදාළ පුරප්පාඩු සඳහා පත් කරනු ලැබේ.)

**සටහන 2**: අයදුම්පත් කැඳවීමේ අවසන් දිනවන විට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ/ I ශ්‍රේණියට උසස්වීමට සුදුසුකම් ලබා ඇති නිලධාරීන්ට පමණක් මෙම පුරප්පාඩු සඳහා අයදුම් කළ හැකි අතර, වෙනත් නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ අධ්‍යාපන සේවා කමිටුව විසින්, ජාතික පාසල් විදුහල්පතිවරු ලෙස පත් කිරීමට නුසුදුසු බවට දන්වා ඇති නිලධාරීන්ට අයදුම් කළ නොහැකිය.

iii. අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 58 ටනොවැඩි විය යුතුය. (දැනටමත් යම් ජාතික පාසලක විදුහල්පති තනතුරේ වැඩ බැලීමට/ රාජකාරි ඉටුකිරීමට/ රාජකාරි ආවරණය කිරීමට විධිමත්ව පත්කර ඇති නිලධාරීන්ට එම විදුහල්පති තනතුරටම ඉල්ලුම් කිරීම සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ.)

**02. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය**

i. අයදුම්කරුවන් විසින් මේ සමඟ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කරන ලද අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර, ලියාපදිංචි තැපෑලෙන් පමණක් පහත දැක්වෙන ලිපිනයට 2020.12.04 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"ජාතික පාසල් විදුහල්පති තනතුර - ශ්‍රී ලං.අ.ප.සේ. – I"** යන්න සඳහන් කොට තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් **"සහකාර ලේකම්, අධ්‍යාපන සේවා ආයතන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල"** යන ලිපිනයට යොමු කළ යුතුය.

**සටහන**

අයදුම්පත් ලියාපදිංචි තැපෑලට යොමු කරන අතර පහත සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනයටද යොමු කළ යුතුය. විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කරන අයදුම්පත් සඳහා කලාප/පළාත් නිර්දේශය සම්මුඛ පරීක්ෂණ දිනයට ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පෙර (2020-12-04) ලැබෙන ලියාපදිංචි තැපැල/ විද්‍යුත් තැපෑලට යොමු කරන ලද අයදුම්පත් සඳහා පමණක් සම්මුඛ පරීක්ෂණ කැඳවීම සිදු කරනු ලැබේ. විද්‍යුත් තැපැල අයදුම්පත පහත ලිපිනයට ලද බව අධ්‍යාපන සේවා ආයතන ශාඛාවෙන් විද්‍යුත් තැපැල මඟින්ම අයදුම්කරු විසින් තහවුරු කර ගත යුතුය.

විද්‍යුත් තැපැල් ලිපිනය - eseas.moe@gmail.com
sasese.moe@gmail.com

ii. ඔබගේ මෑතකදී ලබා ගන්නා ලද අඟල් 2x2$^1/_2$ වර්ණ ඡායාරූපයක් අයදුම්පතේ දකුණු පස ඉහළ කෙළවරෙහි අලවා එවිය යුතු වේ.

**03. ක්‍රමවේදය**

පාසල් පදනම් කරගනිමින් විදුහල්පතිවරු ලෙස නිලධාරීන් තෝරා නොගන්නා අතර, පුරප්පාඩු පවතින පාසල් සංඛ්‍යාවට සමාන නිලධාරීන් සංඛ්‍යාවක් විදුහල්පතිවරු ලෙස පත් කිරීම සඳහා තෝරා ගනු ලැබේ.

කෙසේ වෙතත් අයදුම්පත් යොමු කිරීමේ දී අයදුම්කරුවන්ට තම මනාපය පරිදි පාසල් 3ක් නම් කළ හැකි අතර, විදුහල්පති තනතුරට පත් කිරීමේ දී එම මනාපය ද සලකා බලනු ලැබේ.

ඒ අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් අනුමත කරන ලද මේ සමඟ දක්වා ඇති ලකුණු පටිපාටියට අනුව, එම කමිටුව විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ලබා දෙනු ලබන ලකුණු, අයදුම්කරුගේ මනාපය, අයදුම්කරු සම්බන්ධයෙන් පැවති/පවතින විනය කටයුතු, සහ සලකා බැලිය යුතු වෙනත් කරුණු ද සැලකිල්ලට ගනිමින් අධ්‍යාපන ලේකම් විසින් ලබාදෙන නිර්දේශයන් මත පදනම්ව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් විදුහල්පති තනතුරු සඳහා පත්කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි,

**මහාචාර්ය කපිල සී.කේ. පෙරේරා**
**ලේකම්**
**අධ්‍යාපන අමාත්‍යාංශය**

**<u>ජාතික පාසල් සඳහා විදුහල්පතිවරුන් තෝරා පත් කර ගැනීම ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්</u>**

## යෝජිත ලකුණු පරිපාටිය

*උපරිම ලකුණු 30*

1. **සේවා පලපුරුද්ද**

(විනය දඬුවමක් මත හෝ වැටුප් රහිත නිවාඩු ලබාගැනීම මත හෝ සතුටුදායක සේවා කාලය අහිමි වූ නිලධාරියකුට පමණක් එම කාලය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.)

I ශ්‍රේණියේ සේවා කාලය සඳහා	වසරකට ලකුණු 02 බැගින්

**සටහන:**

*(මාස 12ක සේවා කාලයක් සඳහා පමණක් වසරකට හිමි මුළු ලකුණු සංඛ්‍යාව හිමිවන අතර, ඊට වඩා අඩු කාලයක් සඳහා ලකුණු හිමි නොවේ.)*

*උපරිම ලකුණු 15*

2. **අධ්‍යාපන සුදුසුකම්**

**විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි විශ්ව විද්‍යාලයකින්/ ආයතනයකින් ලබාගත් සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ**

(ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම සඳහා ලකුණු හිමිවන පරිදි එක් සහතිකයකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)

2.1 පශ්චාත් උපාධිය හෝ ඊට ඉහළ සුදුසුකමක් - ලකුණු 15
2.2 පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ලකුණු 12
2.3 මූලික උපාධිය - ලකුණු 09
2.4 පාසල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව - ලකුණු 06

3. **ඉංග්‍රීසි භාෂා නිපුණතාවය** *උපරිම ලකුණු 05*

3.1 ඉංග්‍රීසි ඩිප්ලෝමාවක් හදාරා ලබාගත් සහතිකයක් හෝ ඊට ඉහළ සුදුසුකමක් (ඩිප්ලෝමාවට අදාල කාලසීමාවට මාස 06ක් හෝ ඊට වැඩි විය යුතුයි) - ලකුණු 05
3.2 ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය (සහතික පත්‍ර පාඨමාලාව අදාල කාලසීමාවට මාස 03ක් හෝ ඊට වැඩි විය යුතුයි) -ලකුණු 03

4. **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම** *උපරිම ලකුණු 05*

4.1 තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාවක් හදාරා ලබාගත් සහතිකයක් හෝ ඊට ඉහළ සුදුසුකමක් (ඩිප්ලෝමාවට අදාල කාලසීමාවට මාස 06ක් හෝ ඊට වැඩි විය යුතුයි) - ලකුණු 05
4.2 තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය (සහතික පත්‍ර පාඨමාලාව අදාල කාලසීමාවට මාස 03ක් හෝ ඊට වැඩි විය යුතුයි) - ලකුණු 03

**සටහන:**

ඉහත 3 සහ 4 නිර්නායකයන්ට අදාළ ලකුණු ලබා දීමේදී,

එක් එක් නිර්නායකය යටතේ, ලබා ඇති ඉහළම සුදුසුකම සඳහා ලකුණු හිමිවන පරිදි එක් සහතිකයකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

අදාළ සහතිකවල පාඨමාලා කාලය සඳහන් නොවේ නම්, එම කාලය සනාථ කිරීම සඳහා අයදුම්කරු විසින් අදාළ ආයතනයෙන් ලබාගත් ලිපියක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

**5. සේවා ඇගයීම්** ***උපරිම ලකුණු 05***

අධ්‍යාපන ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පොදු 230 බී ප්‍රශංසා හා දෝෂ දර්ශන ආකෘතියට අනුව විධිමත් පරිදි නිකුත් කරන ලද සේවා ඇගයීම් සඳහා

- එකකට ලකුණු 1 බැගින් උපරිම සේවා ඇගයීම් 5 ක් සඳහා

**සටහන:**

*(දෙපාර්තමේන්තු ප්‍රධානියා යනු, පළාත් අධ්‍යාපන ලේකම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, විභාග කොමසාරිස් ජනරාල් හෝ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ය.)*

**6. අධ්‍යාපනයට අදාළ පර්යේෂණ සහ ප්‍රකාශන** ***උපරිම ලකුණු 05***

(උපරිමය ලකුණු 5කට යටත්ව පහත පරිදි ලකුණු දෙනු ලැබේ)

6.1 පර්යේෂණ - (එක් පර්යේෂණයකට ලකුණු 3 බැගින්)
(පශ්චාත් උපාධියට / පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ පර්යේෂණ/ නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ)

6.2 ප්‍රකාශන - (එක් ප්‍රකාශණයකට ලකුණු 2 බැගින්)
(පෙළපොත් හා ඒ ආශ්‍රිත ග්‍රන්ථ සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර, ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලය මඟින් අනුමතිය ලද ප්‍රකාශන පමණක් ලකුණු ලබා දීමේදී සළකා බලනු ලැබේ)

**7. ඉදිරිපත් කිරීම** ***උපරිම ලකුණු 20***

අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා, වර්තමාන අධ්‍යාපන ප්‍රතිපත්ති හා 21 වන සියවසේ අධ්‍යාපන ක්ෂේත්‍රයෙ හි අභියෝගතා යන ක්ෂේත්‍රයන් පිළිබඳව අවධානය යොමු කරමින් තමා ඉල්ලුම් කරනු ලබන එක් පාසලක් ගැන පූර්ව අධ්‍යයනයක් සිදුකර එම පාසලේ අරමුණු සාක්ෂාත් කිරීමට බලාපොරොත්තු වන සංවර්ධන වැඩපිළිවෙල ඉදිරිපත් කිරීමට දෘඩ පිටපතක් ඉදිරිපත් කළ යුතු අතර, තම ප්‍රායෝගික අත්දැකීම් ද ඇසුරුකර ගනිමින් විනාඩි 05ක වාචික ඉදිරිපත් කිරීමක් කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් කරුණු යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.

| | |
|---|---|
| 7.1 කාලය කළමනාකරණය | - ලකුණු 05 |
| 7.2 සන්නිවේදන කුසලතාවය | - ලකුණු 05 |
| 7.3 අන්තර්ගතය - (පාසල හඳුනාගැනීම, අරමුණු, යෝජනා) | - ලකුණු 05 |
| 7.4 සමස්ථ ඉදිරිපත් කිරීම | - ලකුණු 05 |

**8. සිද්ධි අධ්‍යයනය** ***උපරිම ලකුණු 10***

(සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන වාචික සිද්ධියක් ඇසුරින් ප්‍රශ්ණ යොමු කරනු ලැබේ)

**9. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන සමස්ථ කුසලතාවය හා පෞරුෂත්ව** ***උපරිම ලකුණු 05***

***මුළු ලකුණු <u>100</u>***

2"X 2½"

# ජාතික පාසල් විදුහල්පති තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය - 2020

**<u>ශ්‍රී ලං.අ.ප.සේ 1 ශ්‍රේණියේ විදුහල්පති තනතුරු සඳහා</u>**

1. මුලකුරු සමඟ නම (පැහැදිලි ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලියන්න): ............................................
   ..........................................................................................................................................
   හිමි/මයා/මිය/මෙනෙවිය

2. මුලකුරු වලින් හැඳින්වෙන නම/නම් : ..........................................................................................
   ..........................................................................................................................................

3. 3.1 උපන් දිනය: අවු............. මාසය................ දිනය...........
   3.2 වයස (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට): අවු............. මාස............ දින.............
   3.3 ජාතික හැඳුනුම්පත් අංකය: ..............................................
   3.3 ආගම:.........................................................................................................................
   3.4 ස්ත්‍රී/පුරුෂ භාවය:.....................................................................................................

4. ලිපිනය (ලිපි තැපැල් කළ යුතු ලිපිනය X ලකුණින් දක්වන්න. පැහැදිලි ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලියන්න)
   4.1 රාජකාරී ලිපිනය : ..........................................................................................................
   ...............................................................................................................................
   4.2 රාජකාරී දුරකථන අංකය:..............................................................................................
   4.3 විද්‍යුත් තැපෑල:.................................................................................................................
   4.4 ස්ථිර ලිපිනය:.....................................................................................................................
   ...............................................................................................................................
   4.5 පෞද්ගලික දුරකතන අංකය:............................................................................................

5. 5.1 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත් වූ දිනය: .................................
   5.3 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ Iශ්‍රේණියට උසස් වූ දිනය: .......................

6. 6.1 දැනට දරන තනතුර: .....................................................................................................
   6.2 එම තනතුරට ඔබ පත් කරන ලද ලිපියේ අංකය හා දිනය
   ...............................................................................................................................
   6.3 ඉහත පත්වීම අනුව එම තනතුරේ රාජකාරී භාරගත් දිනය හා අයදුම්පත් කැඳවන දිනට එම තනතුරේසේවාකාලය
   ...............................................................................................................................

7අධ්‍යාපන සුදුසුකම් (ඩිප්ලෝමා/ උපාධි /පශ්චාත් උපාධි ඩිප්ලෝමා/ පශ්චාත් උපාධි)

| උපාධි/පශ්චාත් උපාධි | පෙනී සිටි මාධ්‍යය | ආයතනය | සහතිකය වලංගු වන දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

8ඉංග්‍රීසි භාෂා නිපුණතාව (සහතික පත්‍ර පාඨමාලා/ ඩිප්ලෝමා)

| පාඨමාලාව | ආයතනය | සහතිකය වලංගු වන දිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

9තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන දැනුම (සහතික පත්‍ර පාඨමාලා/ ඩිප්ලෝමා)

| පාඨමාලාව | ආයතනය | සහතිකය වලංගු වන දිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

10විදුහල්පති තනතුර සඳහා ඉල්ලුම් කරනු ලබන පාසල් (මනාපය අනුව අනුපිළිවෙලින් සඳහන් කරන්න)

| **ප්‍රධාන** | **පාසලේ නම** | **අංකය** |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| **අතිරේක** | **පාසලේ නම** | **අංකය** |
| 1 | | |
| 2 | | |

මවිසින් ඉහත සඳහන් කළ තොරතුරු නිවැරදි බව සහතික කරමි.

................................. ................................................

දිනය අයදුම්කරුගේ අත්සන

**11. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය**

11.1- නිලධාරියා 1 ශ්‍රේණියට උසස්වීම් ලබා ඇති දින සිට මේ දක්වා අඩ වැටුප් සහිත /වැටුප් රහිත නිවාඩු ලබා තිබේද? ....................

ලබා ඇත්නම් ඒ පිළිබඳව විස්තර

| අදාළ කාලය පරිච්ඡේදය | විස්තර (අඩ වැටුප් සහිත /වැටුප් රහිත) |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

11.2- නිලධාරියා 1 ශ්‍රේණියට උසස්වීම් ලබා ඇති දින සිට මේ දක්වා ඔහුට විරුද්ධව විනය පියවර ගෙන තිබේද? ...................

විනය පියවර ගෙන ඇත්නම් ඒ පිළිබඳ විස්තර

| අදාළ කාලය පරිච්ඡේදය | විස්තර (විනයපියවර/ විනය නියෝග) |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

11.3 රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ අධ්‍යාපන සේවා කමිටුව විසින්, ජාතික පාසල් විදුහල්පතිවරු ලෙස පත් කිරීමට නුසුදුසු බවට දන්වා ඇති නිලධාරීයකුද ? ......................

අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බවත්, ජාතික පාසල් විදුහල්පති තනතුර සඳහා කැඳවීම් නිවේදනයට අනුව සාමාන්‍ය සුදුසුකම් යටතේ වන අවශ්‍යතාවන් සපුරා ඇති බවත්, දැනට මෙම අයදුම්කරුට විරුද්ධව කිසියම් විධිමත් විනය පරීක්ෂණයක් නොපැවැත්වෙන/පැවැත්වෙන බවත්, පූර්වාසන්න අවුරුදු 05 ක සතුටුදායක සේවා කාලයක් සහිත/රහිත, උසාවියකින් දඬුවම් ලබා ඇති / නොමැති බවත් මෙයින් සහතික කරමි.

................................ .............................................

දිනය

අත්සන
(කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ
නිල මුද්‍රාව)

**12. පළාත් අධ්‍යාපන ලේකම්/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/දෙපාර්තමේනතු ප්‍රධානියාගේ නිර්දේශය**

අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බවටත්, මෙම අයදුම්කරුට විරුද්ධව කිසියම් විනය පරීක්ෂණයක් පැවැත්වෙන/ නොපැවැත්වෙන බවටත් සහතික කරමි. මෙම නිලධාරියා/නිලධාරිනිය විදුහල්පති තනතුරක් සඳහා තෝරාගනු ලැබුවහොත් පළාත් රාජ්‍ය සේවයෙන්/සේවා ස්ථානයෙන් අනුප්‍රාප්තිකයෙකු රහිතව නිදහස් කිරීමට එකඟ වෙමි/නොවෙමි.

................................ .............................................

දිනය

අත්සන
(පළාත් අධ්‍යාපන ලේකම්*/අධ්‍යක්ෂ/දෙපාර්තමේන්තු
ප්‍රධානියාගේ නිල මුද්‍රාව)

*පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් සඳහා පමණක් අදාළ වේ.